**2024-06-03 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල**
**රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. තෝරාගත් ධාන්‍ය වර්ග ආනයනය කිරීම සඳහා වන ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවය ඉවත් කිරීම**

2024-05-01 දින වන විට, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 126ක් යටතේ වර්ගීකරණය කරන ලද, ආහාරයට ගනු ලබන තෝරා ගත් ධාන්‍ය වර්ග සහ භාණ්ඩ වර්ග ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවට යටත් කරනු ලැබ ඇති අතර සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 53කට අදාළ ව ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම දැනට අත්හිටුවා ඇත. මෙම පසුබිම තුළ අනීතිකව සිදු කරන ලාභ ඉපැයීම් (කළු-කඩ ක්‍රියාදාමය) මුලිනුපුටා දැමීම, නීති විරෝධී ආකාරයෙන් සිදු කරන ධාන්‍ය ආනයනය වැළැක්වීම, අයුතු සහ අසාධාරණ ආකාරයෙන් සිල්ලර මිල ඉහළ නැංවීම වැළැක්වීම හා පාරිභෝගිකයාට දරා ගත හැකි මිලක් සහතික කිරීම සහ යෝග්‍ය බදු අනුප්‍රමාණ හා නිරෝධායන ක්‍රමවේද පැනවීම මගින් දේශීය නිෂ්පාදකයින් ආරක්ෂා කර ගැනීම යන බහුවිධ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ධාන්‍ය වර්ග ආනයනය කිරීම සඳහා වන ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාව ඉවත් කිරීම යෝග්‍ය බව පෙනී ගොස් ඇත. ඒ අනුව, ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, මහා භාණ්ඩාගාරයේ ලේකම් හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශක ඇතුළු කමිටුවක් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ සැලකිල්ලට ගෙන ජාතික ශාක නිරෝධායන සේවය මගින් නිකුත් කරන ලද ජාතික ශාක නිරෝධායන බලපත්‍රය ඉදිරිපත් කිරීමට යටත්ව සහ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශ මත පදනම්ව දේශීය නිෂ්පාදකයින් ආරක්ෂා වන පරිදි අවශ්‍ය පියවර ගනිමින් මුං ඇට, උඳු, කව්පි, කුරක්කන්, සෝයා පිටි සහ රටකජු ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාව ඉවත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු - தொ T - (+94 11) 2515759
ෆැ - பெ F - (+94 11) 2514753
ඊ - மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

## 02. පැරිස් ගිවිසුමේ 6 වැනි වගන්තිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම

දේශගුණ විපර්යාස පිළිබඳ නීතිමය බැඳීමක් සහිත ජාත්‍යන්තර ගිවිසුමක් වන පැරිස් ගිවිසුම 2015 වර්ෂයේ පැවති එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ පාර්ශ්වකරුවන්ගේ 21 වන සමුළුවේදී (COP21) පාර්ශ්වයන් 196ක් විසින් සම්මත කරනු ලැබ ඇති අතර, ශ්‍රී ලංකාව 2016 වර්ෂයේදී එම ගිවිසුමට අත්සන් තබා ඇත. ගෝලීය සාමාන්‍ය උෂ්ණත්වයේ වැඩි වීම පූර්ව කාර්මික මට්ටමට වඩා සෙල්සියස් අංශක 02 කට වඩා නොවැඩි මට්ටමක පවත්වා ගැනීම සහ උෂ්ණත්වය වැඩි වීම පූර්ව කාර්මික මට්ටමට වඩා සෙල්සියස් අංශක 1.5ක් දක්වා සීමා කිරීම පැරිස් ගිවිසුමේ ප්‍රධාන අරමුණ වේ. එම ගිවිසුමේ විධිවිධාන අනුව, පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් "ජාතික වශයෙන් නිර්ණය කළ දායකත්ව (NDCs) ඉලක්ක" ක්‍රියාත්මක කළ යුතු අතර, ඒ සඳහා වෙළෙඳපොළ යාන්ත්‍රණයන් 02ක් හඳුන්වා දී ඇත. එමගින්, පාර්ශ්වකාර රටවල්වල හරිතාගාර වායු අවම කිරීමේ ප්‍රතිඵල ද්විපාර්ශ්විකව හුවමාරු කර ගැනීමටත්, එවැනි හරිතාගාර වායු හුවමාරු වාර්තා කිරීමට සහ පාර්ශ්වකාර රටවල ජාතික වශයෙන් නිර්ණය කළ දායකත්වයන් සාක්ෂාත් කර ගැනීම සඳහා උපයෝගී කර ගැනීමටත් අවකාශ සලසනු ලබයි. එසේම, එම ගිවිසුම මගින් නව ජාත්‍යන්තර කාබන් හර කිරීමේ යාන්ත්‍රණයක් ද හඳුන්වා දී තිබේ. එම තත්ත්වය යටතේ ශ්‍රී ලංකාව විසින් එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ ඩුබායි කලාපීය සහයෝගිතා මධ්‍යස්ථානයේ තාක්ෂණික සහාය ඇතිව කාබන් වෙළෙඳපොළ උපායමාර්ග සහ මාර්ගෝපදේශ මූලධර්ම සකස් කරමින් සිටින අතර, මෙම වර්ෂය අවසන් වන විට එම කාර්යය නිම කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ඒ අතරතුර හරිතාගාර වායු විමෝචන අඩු කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් හඳුනාගනු ලැබ ඇති විදුලිය, කර්මාන්ත, අපද්‍රව්‍ය කළමනාකරණය, ප්‍රවාහනය, කෘෂිකර්මය සහ වනාන්තර යන ප්‍රධාන ක්ෂේත්‍රයන්ට අදාළව විවිධ ව්‍යාපෘති සංවර්ධකයින් විසින් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරනු ලැබ ඇත. කාබන් වෙළෙඳපොළ උපායමාර්ග සහ මාර්ගෝපදේශ මූලධර්ම ක්‍රියාත්මක කරනු ලබන තෙක් එකී ව්‍යාපෘති යෝජනා ඇගයීමට ලක් කර තීරණයන්ට එළඹීම සඳහා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීම පිණිස පරිසර අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් ඇති කිරීම සඳහා අධ්‍යාපන පරිපාලන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම**

රටේ සෑම ශිෂ්‍යයෙකුටම සම ප්‍රවේශ අවස්ථා සහ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම අරමුණු කරගෙන, "වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවක්" යන දැක්මට අනුකූලව සකස් කර ඇති ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2023-2033 මඟින් අධ්‍යාපනයේ සිදු විය යුතු පරිවර්තනීය වෙනස පිළිබඳව කරුණු ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒ අනුව, දීර්ඝකාලීන ඉගෙනුම් ක්‍රමවේදයක් තහවුරු කිරීම සඳහා ආයතනික ව්‍යුහය, විෂයමාලා හා ඇගයීම් ක්‍රමවේදය තුළ නව පරිවර්තනයක් සිදු කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරනු ලැබ ඇති අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ නිර්දේශ මත පදනම්ව සමස්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කාර්යක්ෂමව හා ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පරිපාලන ව්‍යුහයක් ස්ථාපිත කිරීමේ අරමුණින් පහත සඳහන් පරිදි පියවර ගැනීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පාසල් වර්ගීකරණය කිරීම.
* අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඒකක 09ක් පළාත් 09 තුළ ස්ථාපිත කිරීම.
* කලාප අධ්‍යාපන කාර්යාල සංඛ්‍යාව විද්‍යාත්මක හා ප්‍රමුඛතා අනුපිළිවෙළක් මත පදනම්ව 100 සිට 122 දක්වා අදියර වශයෙන් වැඩි කිරීම.
* පාසල් සුපරීක්ෂණය, ගුරුවරු අධීක්ෂණය සහ පාසල් පාදක ඇගයීම්වල වලංගුතාව තහවුරු කිරීම අරමුණු කර ගනිමින් දැනට පවතින කොට්ඨාස අධ්‍යාපන කාර්යාල 314 ද ඇතුළත් කර ගනිමින් පාසල් මණ්ඩල 350ක් ස්ථාපිත කිරීම.
* තෝරාගත් ද්විතියික පාසල් එකක් හෝ කිහිපයක් ප්‍රමුඛ පාසල් ලෙස නම් කරමින් එක් පොකුරක් පාසල් 8 සිට 12ක් පමණ වන සංඛ්‍යාවකින් සමන්විත වන පරිදි සමස්ත පාසල් පද්ධතිය පාසල් පොකුරු 1,220කට ඇතුළත් කිරීම.
* ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සහ ගුරු උපදේශක සේවය සඳහා අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීම.

**04. 2032 බ්‍රිස්බේන් ඔලිම්පික් තරගාවලිය ඉලක්ක කරගනිමින් පාසල් මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා වර්ධනය කිරීම පිණිස රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකාව 2032 බ්‍රිස්බේන් ඔලිම්පික් තරගාවලියේදී "පදක්කම් දිනන රටක්" ලෙස අදිටන් කරගනිමින් පෞද්ගලික අංශයේ සහ සිවිල් සමාජයේ සහයෝගය ඇතිව ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් සැලසුම් කරනු ලැබ ඇත. එසේම, කුසලතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් 2028 වසරේ ලොස් ඇන්ජලීස්හි පැවැත්වීමට නියමිත ඔලිම්පික් උළෙලට සහභාගි කරවා සැලකිය යුතු පරිසාධන මට්ටමක් ළඟා කර ගැනීම සඳහා ඔවුන්ට අවස්ථාව සලසා දීමටද අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යෝජිත වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා ඒකාබද්ධව ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. රත්නපුර නව නගරයේ පිහිටි ඉඩම් කොටසක් සබරගමුව පළාත් සභාව වෙත ලබා දීම**

රත්නපුර නව නගරයේ පළාත් සභා සංකීර්ණය අසල හෙළ බොජුන්හලක් ස්ථාපනය කිරීම සඳහා ඉඩම් කොටසක් ලබා දෙන ලෙස සබරගමුව පළාත් සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගනු ලැබ ඇති පර්චස් 23.10ක ඉඩම් කොටයක් හඳුනාගෙන තිබේ. එම ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කර ඇති වෙළෙඳපොළ වටිනාකම දැනටමත් සබරගමුව පළාත් සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවනු ලැබ ඇත. ඒ අනුව, එකී ඉඩම් කොටස රත්නපුර ප්‍රාදේශීය ලේකම් මගින් සබරගමුව පළාත් සභාව වෙත පැවරීමට හැකි වන පරිදි ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිදහස් කිරීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන්හි 2024 පළමු කාර්තුව අවසන් වන විට ප්‍රගතිය**

රජයේ අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන්හි 2024 පළමු කාර්තුව අවසන් වන විට මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳව අදාළ අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද කාර්යසාධන දත්ත හා තොරතුරු සමාලෝචනය කර ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කරනු ලැබ තිබේ. එකී වාර්තාව අනුව, 2024 වර්ෂයේ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 171ක් ක්‍රියාත්මක වන අතර ඉන් ව්‍යාපෘති 09ක් හැර, අනෙකුත් සියලුම ව්‍යාපෘති 2026 වර්ෂය අවසන් වන විට නිම කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, නව ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය අවකාශය සලසා ගැනීමට හැකි වන පරිදි දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, භෞතික ප්‍රගතිය 80%කට වැඩි ව්‍යාපෘති 58ක ක්‍රියාකාරකම් 2024 වර්ෂය තුළ නිම කිරීමටත්, ප්‍රමාණවත් අරමුදල් නොමැති වීම හේතුවෙන් දැනට අත්හිටුවා ඇති ව්‍යාපෘති සඳහා තවදුරටත් මුදල් ආයෝජනය කිරීමට පෙර එවැනි ව්‍යාපෘති පිළිබඳව අවශ්‍ය අධ්‍යයනයන් සිදු කිරීම සඳහා ජාතික මෙහෙයුම් මැදිරි නිලධාරි කමිටුව වෙත යොමු කිරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. බලපෑම් සහිත කාලගුණය, ගංවතුර හා නායයෑම් පිළිබඳව පුරෝකථනයන් සහ පූර්ව අනතුරු ඇඟවීම වැඩිදියුණු කිරීම සඳහා ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ තාක්ෂණික සහාය ලබා ගැනීම**

ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සහ ලෝක බැංකුව අරමුදල් සපයනු ලබන දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය අදියර 03ක් යටතේ වසර 09ක් පුරා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. සංරචක 05කින් සමන්විත එම වැඩසටහනෙහි පළමු සංරචකය වශයෙන් කාලගුණික තත්ත්වයන් නිරවද්‍ය ලෙස පුරෝකථනය කිරීමට හා පූර්ව ඇඟවීමට හැකි වන පරිදි අදාළ ආයතනවල කුසලතා, තාක්ෂණය හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව කටයුතු කිරීම මඟින් අධි අවදානම් කාලගුණික හා දේශගුණික තත්ත්වයන් ඉතා ඉක්මණින් නිරවද්‍ය ලෙස පුරෝකථනය කර ගැනීමටත්, පශ්චාත් ආපදා කළමනාකරණ කටයුතු සඳහා වාර්ෂිකව රජය විසින් වැය කරනු ලබන ඇමෙරිකානු ඩොලර්

මිලියන 313ක් පමණ වන ඇස්තමේන්තුගත පිරිවැය අවම කර ගැනීමටත් හැකි වනු ඇති බවට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, එකී සංරචකය ක්‍රියාත්මක කිරීම පිණිස කාලගුණ විද්‍යාත්මක හා ජල විද්‍යාත්මක ක්ෂේත්‍රයේ පුළුල් අත්දැකීම් සහිත හා හදිසි ආපදා අනතුරු ඇඟවීම් පද්ධති වැඩිදියුණු කිරීමේ තාක්ෂණික හැකියාව පවතින ජාත්‍යන්තර සංවිධානයක් වන ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ සේවය ලබා ගැනීම පිණිස වාරිමාර්ග අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම

අපරාධ නඩු කඩිනමින් විසඳාගැනීම, අධිකරණ කටයුතුවල ප්‍රමාදයක් අවම කර ගැනීම තුළින් නඩු ගොඩ ගැසීම අඩු කර ගැනීම මෙන් ම බන්ධනාගාර තදබදය අඩු කර ගැනීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ නීතිමය රාමුව තුළට වරද පිළිබඳව එකඟතාවකට පත් වීම සඳහා වූ ක්‍රමවේදය හඳුන්වා දීමට හැකි වන පරිදි අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා 2023-03-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. යෝජිත සංශෝධනය අනුව නඩු විභාගයකට පෙනී සිටීම වෙනුවට වරද පිළිගැනීමේ එකඟතාවක් විත්තිය හා පැමිණිල්ල අතර ඇති කර ගනු ලබන බැවින්, එහි ප්‍රතිඵලයක් ලෙස දඩුවම්, දඩ මුදල් හෝ වන්දි මුදල් අවම කර ගැනීම සඳහා නිර්දේශයක් ලබා ගැනීමට හැකි වනු ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පතට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. අදාළ පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා පිහිටුවීම

ජාත්‍යන්තර යහපරිචයන් ද සැලකිල්ලට ගනිමින්, විෂය ප්‍රවීණයන්ගේ සහයෝගය ඇතිව සිදු කරනු ලැබ ඇති සමාලෝචනයකින් පසු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වඩාත් ඵලදායි අයුරින් මෙහෙයවීම සහ සංවර්ධනය සඳහා ඒකාබද්ධ නියෝජිතායතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, අපනයන සංවර්ධන මණ්ඩලයේ, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ, කාර්මික සංවර්ධන මණ්ඩලයේ, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සහ ක්‍රීඩා හා යෞවන කටයුතු

අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ආයතනික සහ නෛතික රාමු ප්‍රතිනිර්මාණය කිරීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා කැපවූ තනි අස්ථිත්වයක් වශයෙන් "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" නමින් යෝජිත ආයතනය පිහිටුවීමටත්, ඒ සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් ලබා දීමටත් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සඳහා සංශෝධන**

එකතු කළ අගය මත බදු පනතින් බදු නිදහස් කිරීම් ඉවත් කිරීමේ අනපේක්ෂිත බලපෑම වළක්වා ගැනීම, පනතේ පැහැදිලි බව පවත්වා ගැනීම හා 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් හඳුන්වා දෙන ලද එකතු කළ අගය මත බදු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා මෙන්ම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව, ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව සහ ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව ඇතුළුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ප්‍රධානත්වයෙන් යුත් ඒකාබද්ධ කමිටුවේ උපදෙස් අනුව පත් කරනු ලැබ ඇති තාවකාලික වැට් කමිටුව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ පරිදි හඳුනාගනු ලැබ ඇති සංශෝධන සහ විවිධ අමාත්‍ය මණ්ඩල තීරණ මත වරින්වර හඳුනාගනු ලැබ ඇති අනෙකුත් සංශෝධනද ඇතුළත් කරමින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. නිරිතදිග මෝසම් තත්ත්වය හමුවේ පීඩාවට පත්ව ඇති ජනතාවට සහන සැලසීම**

මෙවර නිරිතදිග මෝසම් තත්ත්වය සක්‍රිය වීමත් සමඟම අනපේක්ෂිත අයුරින් වර්ධනය වෙමින් පවතින කාලගුණ විපර්යාසවල ප්‍රතිඵලයක් ලෙස, දිවයිනේ දිස්ත්‍රික්ක ගණනාවකම අධික වර්ෂාව හේතුවෙන් නායයෑම්, ගස් කඩා වැටීම්, ගංවතුර මෙන්ම පොදු යටිතල පහසුකම් පද්ධතිවලට දැඩි හානි සිදු වීමෙන් පවුල් දහස් ගණනක් තාවකාලිකව අසරණ භාවයට පත්ව ඇත. එබැවින්, ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක

බලකායේ සේවය ලබා ගනිමින් අදාළ අනෙකුත් අමාත්‍යාංශවල පූර්ණ දායකත්වයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි බලපෑමට ලක්වී ඇති පවුල් සඳහා සහන සැලසීමට සහ හානියට පත්ව ඇති පොදු යටිතල පහසුකම් යළි ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමේ ක්ෂණික වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. කොලොන්නාව ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය හේතුවෙන් පීඩාවට පත්ව ඇති ජනතාවට සහන සැලසීම**

පසුගිය දින කිහිපය තුළ පැවති අධික වර්ෂාව හේතුවෙන් කොලොන්නාව ප්‍රදේශයේ මහජනතාව මුහුණ පා ඇති තත්ත්වය පිළිබඳ සොයා බැලීම පිණිස ගරු ජනාධිපතිතුමා 2024-06-03 දින පස්වරුවේ එම ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවක යෙදී ඇත. එම නිරීක්ෂණ චාරිකාවේදී ප්‍රදේශයේ ජනතාව විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගනිමින් ගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනා සඳහා අනුමැතිය ලබා දෙන ලදී:

* ගංවතුර හේතුවෙන් බලපෑමට ලක්ව ඇති කොලොන්නාව ප්‍රදේශයේ ජනතාවට මෙන්ම රටේ අනෙකුත් ප්‍රදේශවල බලපෑමට ලක්ව ඇති ජනතාවට ආහාරපාන සැපයීම සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවාවන් සලසා දීම.
* කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුර තත්ත්වයන්ට හේතු වී ඇති අනවසර ඉදිකිරීම් වහාම ඉවත් කිරීම, ඉඩම් ගොඩකිරීමේ කටයුතු නැවැත්වීම සහ ප්‍රදේශයේ කාණු පද්ධතිය පිළිසකර කිරීම ඇතුළුව අනෙකුත් අදාළ පියවරයන් ගැනීම.
* එම ප්‍රදේශයේ ගංවතුර තත්ත්වයන් ඇතිවීම සඳහා බලපා ඇති මූල හේතූන් හඳුනා ගෙන ඉදිරියේදී එවැනි තත්ත්වයන් නැවත ඇති නොවන පරිදි ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමට සහ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පවතින ඉඩම් උපරිම ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගනිමින් කොලොන්නාව නගරය නැවත සැලසුම් කිරීම පිණිස සවිස්තරාත්මක සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ අදාළ අනෙකුත් ආයතනවල නියෝජනයන්ගෙන් යුත් කමිටුවක් පත් කිරීම.

***************